නාරම්මල ප්‍රාදේශීය සභාව.

කුරුණෑගල දිස්ත්‍රික්කය

------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 03 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජුලි 27 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට නාරම්මල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත විය යුතු රු.1,592,677 ක් වටිනා වත්කම් විෂයයන් 09 ක් ගිණුම්ගතව නොතිබුණි.

1.3.2 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 10,439,760 ක් විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.22,960,200 ක් විය. මින් ආසන්න වශයෙන් 0.78% ලෙස රු. 179,841 ක් වසර 3 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් විය. මීට අමතරව වසර දෙකක කාලයක් ඉකුත් වී තිබූ අලව්ව ප්‍රාදේශීය සභාවට නිරවුල් කල යුතු රු.187,674 ක ශේෂයක් පැවතුණි.

1.3.3 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

කුලී ආදායම් රු.11,337,348 කට අදාලව උපලේඛණගත තොරතුරු හා කාලවිශ්ලේෂණ ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ගිණුම් විෂයය පිළිබඳ සතුටුදායක පරීක්ෂාවක් කල නොහැකි විය.

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.6,344,445ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,293,799ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,050,646 ක වර්ධනයක් පැවතුණි. මෙකී මෙහෙයුම් ප්‍රතිඵලයට රු.38,491,790 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.41,972,786 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.2,863,449 ක අතිරික්තයක් බවට පත්ව තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.77,856,088 න් ආසන්න වශයෙන් සියයට 66.99 ක් ලෙස රු.52,159,149 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.38,491,790 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලබා දී ඇති මුදල් විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.71,511,643 න් ආසන්න වශයෙන් සියයට 56.93 ක් ලෙස රු.40,712,936 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම විය. ඉන් ආසන්න වශයෙන් සියයට 85.49 ක් ලෙස රු.34,808,098 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් ලබා දී තිබුණු අතර එම වටිනාකම වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ප්‍රාග්ධන වියදම වූ රු.41,972,786 න් ආසන්න වශයෙන් සියයට 8.29 ක් ලෙස රු.3,480,996 ක් පමණක් සභා අරමුදලින් වැය කර තිබූ අතර ආසන්න වශයෙන් ඉතිරි සියයට 91.71 ක් වූ රු.38,491,790 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදන මත ඉටුකල සංවර්ධන කාර්යයන් විය.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 බදු කුලී

වෙළඳ ස්ථාන කුලී උපලේඛණය අනුව වූ 2014 ජනවාරි 01 දිනට හිඟව පැවති රු.67,100 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.144,270 ක් ලෙස ආසන්න වශයෙන් සියයට 215 කින් වැඩි වී තිබුණි.

#### 2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.367,410 ක්ද මුද්දර ගාස්තු රු.5,825,675 ක්ද විය.

03. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

<u>නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්</u>

පිරිවැය රු.275,500 ක් වූ කුට්ටිගල් නිෂ්පාදන යන්ත්‍ර දෙකක් හා පිරිවැය රු.580,260 ක් වූ අංක 49-7824 දරන පෝඩ් ට්‍රැක්ටරය සමාලෝචිත වර්ෂය තුල නිශ්ක්‍රීයව පැවතුණි.

04 <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) වත්කම් කළමනාකරණය